සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | MF/WBB02/Notice/D/Div/2023 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2023.08.28 |

දිස්ත්‍රික් ලේකම් මගින්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ මුදල් ගෙවීම</u>

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ඉදිරිපත් වූ අභියාචනා හා විරෝධතා සම්බන්ධයෙන් අභියාචනා කමිටු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. තවද විරෝධතා ඉදිරිපත්වූ සුදුසුකම්ලාභීන් හැර අනෙක් සුදුසුකම්ලාභීන් වෙත බැංකු ගිණුමක් නොමැති නම් නව ගිණුම් විවෘත කිරීමේ කටයුතු ද තව දුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. දැනටමත් තහවුරු කරගෙන ඇති බැංකු ගිණුම් සහ අලුතින් විවෘත කරගෙන ඇති බැංකු ගිණුම් සම්බන්ධයෙන් පවතින විවිධ ගැටළු ද නිරාකරණය කරමින් පවතී.

දැනට අභියාචනා සහ විරෝධතාවලට ලක් නොවී ඇති සහ 2023 ජූලි 31දින වන විට නිවැරදි බැංකු ගිණුම් ඇති බවට පරීක්ෂාකර තහවුරු කරගෙන ඇති සුදුසුකම්ලාභීන් අතුරින් තව දුරටත් පරීක්ෂා කළ යුතු විවිධ ගැටළු ඇති බවට හඳුනා ගෙන ඇති සුදුසුකම්ලාභීන් හැර ඉතිරි සුදුසුකම්ලාභීන් සඳහා 2023 ජූලි මසට අදාළ පළමු වටයේ ප්‍රතිලාභ පිරිනැමීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර ඇත.

ඒ අනුව සුදුසුකම්ලාභීන් 791640ක් සඳහා 2023.08.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ගිණුම්වලට නියමිත ප්‍රතිලාභ මුදල් යැවීම සඳහා නියමිත ක්‍රියා පටිපාටිය අනුව පියවර ගෙන ඇත. දිස්ත්‍රික් අනුව සහ කාණ්ඩ වර්ගීකරණය අනුව එසේ පළමුවටයේ ප්‍රතිලාභ ගෙවීම සිදුකරනු ලබන සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛණය, හිමිකම් ලබන කාණ්ඩය හා මුදල් ප්‍රමාණය ද සමග දිස්ත්‍රික් ලේකම් මගින් එම කාර්යාලයේ අස්වැසුම වැඩසටහනේ සම්බන්ධීකාරක වෙත Excel sheet මගින් එවනු ලබන අතර ඔහු විසින් එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව සකස් කර ඔබ වෙත ලබා දෙනු ඇත.

පළමුවටයේ ප්‍රතිලාභ ගෙවීම් සඳහා අදාළ කර ගෙන ඇති සුදුසුකම්ලාභීන් විසින් කරනු ලබන විමසීම් සඳහා පිළිතුරු දීමට ඔබේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන මෙන්ද ඉල්ලමි. ඒ අනුව එසේ දැනට ගෙවීම් අත්හිටුවා ඇති සුදුසුකම්ලාභීන් පහත සඳහන් පරිදී වර්ගීකරණය කළ හැක.

I. අභියාචනා හෝ විරෝධතාවලට ලක්වූ තැනැත්තන්
II. දී තිබූ හෝ අලුතින් විවෘතකරන ලද බැංකු ගිණුම් සම්බන්ධයෙන් නැවත පරික්ෂා කළයුතු ගැටළු හෝ දෝෂ පවතින තැනැත්තන්
III. ජාතික හැඳුනුම්පත් අංක හා ගෘහ ඒකක අංක වැනි දත්ත මගින් පරික්ෂා කිරීමේදී ද්වීගණනය වූ අයදුම්පත් සහිත තැනැත්තන්
IV. විවිධ තාක්ෂණික දෝෂ නිසා නිරවද්‍යතාවය පිළිබඳව නැවත පරික්ෂා කළයුතු අයදුම්පත්
V. තනි පුද්ගල පවුල්වල අයදුම්කරු මිය ගිය අවස්ථාවන්
VI. බදුල්ල, පොළොන්නරුව, නුවරඑළිය සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හී සංක්‍රාන්තික කාණ්ඩය සඳහා ගෙවීම් අභියාචනා කමිටු තීරණ වලින් පසුව ගෙවීමට ද තීරණය කර ඇත.

ඉතිරි සුදුසුකම්ලාභීන් වෙත 2023 ජූලි මාසයට නියමිත ප්‍රතිලාභ මුදල් පිරිනැමීම පහත සඳහන් ආකාරයට ඉදිරියටත් සිදුකරනු ලබන බවද කාරුණිකව සලකන්න.

දෙවන පියවර :- අභියාචනා සහ විරෝධතාවලට ලක් නොවූ ,

I. අලුතින් බැංකු ගිණුම් විවෘත කරනු ලබන සුදුසුකම්ලාභීන්
II. පවතින බැංකු ගිණුම්වල හා නව බැංකු ගිණුම්වල පවත්නා ගැටළු විසඳනු ලැබූ සුදුසුකම්ලාභීන්
III. විවිධ තාක්ෂණික ගැටළු විසඳනු ලැබූ සුදුසුකම්ලාභීන්
IV. අත්හිටුවන ලද වෙනත් ගැටළු සහිත අයදුම්පත් වලට අදාළ එම ගැටලු විසඳීමෙන් පසුව ගෙවීමට සුදුසුකම් ලබන්නන්

තුන්වන පියවර :-

I. විරෝධතා පරික්ෂා කිරීමෙන් පසුව විරෝධතාවලට ලක්වූ අය අතුරින් සුදුසුකම් ලබන තැනැත්තන් (බැංකු ගිණුම් නොමැති අය සඳහා ගිණුම් විවෘත කිරීමෙන් පසුව )
II. තව දුරටත් අළුතින් ගිණුම් විවෘත කරන ලද විරෝධතා හා අභියාචනා නොමැති තැනැත්තන්

සිවුවැනි පියවර:-

අභියාචනා විභාග කිරීමෙන් පසුව අළුතින් සුදුසුකම් ලබන තැනැත්තන්, කාණ්ඩය වෙනස් වී සුදුසුකම් ලබන තැනැත්තන් හා කාණ්ඩය වෙනස් නොවී සුදුසුකම් ලබන තැනැත්තන් (බැංකු ගිණුම් නොමැති පුද්ගලයින් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීමෙන් පසුව )

සුදුසුකම්ලාභී ලැයිස්තුවෙන් කොටසකට පමණක් ප්‍රතිලාභ ගෙවීමේදී එසේ සිදුකිරීමට හේතුවූ කරුණු හා එසේ තෝරාගත් ආකාරය පිළිබඳව සුදුසකම්ලාභීන් සහ සාමාන්‍ය ජනතාව හරිහැටි දැනුවත් නොවුනහොත් ගැටළුකාරී තත්වයන් ඇතිවිය හැකි බැවින් ද මේ පිළිබඳව ඔබ කාර්යාලයට ඉදිරිපත්වන විමසීම් වැඩිවිය හැකි බැවින් ද මේ පිළිබඳව පූර්ව ප්‍රචාරයක් පුළුල් වශයෙන් ලබා දීම ද වැදගත්වේ. ජතික මට්ටමින් ප්‍රචාරයක් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් යොදා ඇති අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ද සුදුසු වැඩපිළිවෙලක් යෙදීම මැනවි.

මෙතෙක් මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දැක්වූ අනගි සහාය ඉතා ඉහලින් අගය කරන අතර මෙම පියවරද ඒ ආකාරයටම සාර්ථක කර ගැනීමට ඔබේ නායකත්වය බලාපොරොත්තු වෙමි .

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

o/c